# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යටතේ වන ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) තනතුර සඳහා වන සීමිත තරග විභාගය -2024

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) තනතුරෙහි පවතින පුරප්පාඩු 06ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් දැනට සක්‍රීය සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 දෙසැම්බර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී පවත්වනු ඇත.

මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, අංක 170, කිරුළ පාර, කොළඹ 05 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) තනතුර සඳහා වන සීමිත තරග විභාගය - 2024" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනය **2024.09.23** දින වේ.

**සටහන:** අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *තනතුරට අදාල කාර්යයන් :*

ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කටයුතු දිස්ත්‍රික් මට්ටමේ දී සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කිරීම, දිස්ත්‍රික්කය තුළ පවතින තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ප්‍රශස්ථ සහ ඵලදායි පරිහරණයකට යොමු කිරීමට අවශ්‍ය විද්‍යාත්මක සැලසුම් සැකසීම, අධීක්ෂණය හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම, විවිධ ආයතනයන් වෙත ඉඩම් පරිහරණ සැලසුම් ක්ෂේත්‍රයට අදාළ භූමි පරිහරණ සැලසුම් නිර්දේශ ලබා දීම, දිස්ත්‍රික් ලේකම්වරයා සභාපතිවරයා ලෙස කටයුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණය පිළිබඳව තීරණය දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් දිස්ත්‍රික් කාර්යාලයේ මූල්‍ය හා පරිපාලන කටයුතු පවත්වාගෙන යාම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ අධීක්ෂණ කටයුතු.

2. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයේ සියලු විෂයයන් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේ දී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොඅඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ලිඛිත විභාගයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් මුළු ලකුණුවල එකතුව මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු පරිවාස කාල සීමාවකට යටත් වේ.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට සිදුකර ඇති හෝ ඉදිරියේ දී සිදුකරනු ලබන සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

V. පත්වීම ක්‍රියාත්මක වන දිනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි පත්වීම් ලිපි නිකුත් කරනු ලබන දිනය හෝ ඊට පසු දිනයක් වනු ඇත.

4. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016,රු. 47,615-10x1335-8x1630-17x2170- රු.110,895/-ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

5. *අධ්‍යාපන සුදුසුකම්:*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක භූගෝල විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳව විශේෂ උපාධියක් හෝ භූගෝල විද්‍යාව විෂයයක් සහිතව සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

6. *පළපුරුද්ද:*

I. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී තනතුරේ හෝ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී තනතුරේ රාජකාරීන්ට සමාන රාජකාරි පවරා ඇති ඉහත දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින සංවර්ධන නිලධාරියෙකු වීම.

II. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව තුළ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. සේවය ස්ථිර කර ඇති නිලධාරියෙකු වීම.

7. *වයස් සීමාව :*
දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහාවන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

8. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

9. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10. *ලිඛිත තරග විභාගය :*

10:1 ලිඛිත තරග විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ:

| *අංකය* | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

10:2 විෂය නිර්දේශය

(අ) විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය

විවිධ මට්ටම්වලින් ඉඩම් භාවිතය සඳහා විද්‍යාත්මක ලෙස ඉඩම් පරිහරණය, සැලසුම්කරණය කිරීම හා විවිධ පරිහරණයන් සඳහා භූමිය තාර්කික ලෙස බෙදා වෙන් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

(ආ) බුද්ධි පරීක්ෂණය
සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහ සහ අන්තර් සම්බන්ධතාවලට අදාළව ඉදිරිපත් කෙරෙන, විශ්ලේෂණ, අර්ථකථන, තාර්කික හැකියාව ආදිය මැන බැලෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ.

11. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය*
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර, එහිදී පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු* | *තෝරා ගැනීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>1.1 පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද භූගෝල විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ විශේෂවේදී උපාධිය<br>-පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා - 20<br>-දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා - 15<br>-දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා - 10 | 20 | අදාල නොවේ |
| 1.2පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද සාමාන්‍ය උපාධියක් සඳහා භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම<br>-පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා - 18<br>-දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා - 13<br>-දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා - 08<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.) | | |
| 2. ඉංග්‍රිසි භාෂා ප්‍රවීණතාව:<br>ඉංග්‍රිසි භාෂා මාධ්‍යයෙන් හදාරන ලද ප්‍රථම උපාධිය/ පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>-ඉංග්‍රීසි භාෂාව උපාධියේ ප්‍රධාන විෂයක් වශයෙන් ගෙන සමත් වීම - 15<br>-රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රිසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ ඊට වැඩි) - 12<br>-සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 06ක් හෝ ඊට වැඩි) - 10<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 15 | |
| 3. වෘත්තීය සුදුසුකම් :<br>තනතුරට අදාල ක්ෂේත්‍රයේ<br>-පශ්චාත් උපාධිය - 20<br>-පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 15<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 20 | |

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු* | *තෝරා ගැනීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 4.තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව පිළිබඳ ලබා ඇති සුදුසුකම්:<br><br>-විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා ලකුණු - 20<br><br>-තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව පිළිබඳ වසරක හෝ ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා ලකුණු - 15<br><br>-තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව පිළිබඳ මාස 06ක හෝ අවුරුද්දකට අඩු කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා ලකුණු - 10<br><br>-තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව පිළිබඳ මාස 03කට වැඩි මාස 06කට අඩු කාලයක් සඳහා වන සහතිකයක් සඳහා ලකුණු - 05<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 20 | |
| 5. අතිරේක පළපුරුද්ද:<br>මූලික සුදුසුකම් ලෙස සලකා බලන වසර 05 හැර ඊට වැඩි සෑම වසරක් සඳහා ලකුණු 01 බැගින් | 20 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු එකතුව | **100** | **40** |

12. *විභාග කොන්දේසි :*

I. අයදුම්පත සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් සකස් කළ යුතු අතර, අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය 2,3 පිටුවලට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාළ අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පතෙ හි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ.

II. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා ප්‍රවේශපත්‍රය නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදනයක් පළකරනු ලැබේ. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 05 කටවත් පෙර තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයින් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.

ඔබ වෙත තබාගත් අයදුම්පතෙහි ඡායාපිටපතක් ද, ලියාපදිංචි කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

III. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්නපත්‍ර දෙකට ම (02) පෙනී සිටිය යුතුය.

IV. විභාග ගාස්තුව රු. 1200/-කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ගිණුම් අංකයට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුවන්ගේ නමින් ලබාගන්නා ලදුපතෙහි දාරය මගින් අයදුම්පතේ නිශ්චිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

VI. මෙම විභාගය කොළඹ නගරයේ දී පමණක් පැවැත්වේ. විභාගය පැවැත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

VII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

VIII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

IX. ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

X. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකු ම විභාගශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එක් ලේඛනයක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගැනීමට හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකු ම තම අත්සන තම ආයතන ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්යය වේ. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් තම අංශ ප්‍රධානී මාර්ගයෙන් ද දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්තව සේවයේ නියුතු නිලධාරීන් තම දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) මාර්ගයෙන් ද අයදුම්පත් එවිය යුතුය

*සැලකිය යුතුය :*

i. අයදුම්පතට කිසිම ලේඛනයක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.
ii. බඳවා ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණයේ දී ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

13. සාවද්‍ය තොරතුරු සැපයීම ඃ

යම් අපේක්ෂකයෙකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලසීමාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකියාව ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහකිරීමට හැකියාව ඇත.

14. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය.

"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

2024 අගෝස්තු මස 22 දින